- www.pastpapers.wiki -

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## වර්ෂ අවසාන ඇගයීම - 2016
## විද්‍යාව
## 07 ශ්‍රේණිය

නම / විභාග අංකය :- ..........................................................................

කාලය : පැය 02යි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

I කොටස

01. රූපයේ දක්වා ඇති පත්‍රය සම්බන්ධයෙන් කුමන ප්‍රකාශය සත්‍යවේ ද?
(i) ඒක බීජ පත්‍රී ශාක පත්‍රයකි.
(ii) ද්වි බීජ පත්‍රී ශාක පත්‍රයකි.
(iii) සමාන්තර නාරටි වින්‍යාසයක් ඇත.
(iv) පැහැදිලිව කිව නොහැක.

02. ශාක මුල්වලින් කෙරෙන ප්‍රධාන කාර්යය වන්නේ මින් කවරක් ද?
(i) මල් ඵල දැරීම (ii) ප්‍රභාසංශ්ලේෂණ
(iii) ශ්වසනය (iv) ජලය හා ඛනිජ ලවණ අවශෝෂණය

03. ජලය ශ්වසන මාධ්‍යයක් ලෙස වැදගත් වන්නේ පහත සඳහන් කුමන ජීවියාට ද?
(i) දිය නයා (ii) ඉදිබුවා (iii) මත්ස්‍යයා (iv) නෙළුම් ශාකය

04. සංයුක්ත අන්වීක්ෂයක කදාව තැන්පත් කළ පසුව නිදර්ශකය පැහැදිලිව බැලීමට භාවිතා කරනු ලබන කොටස වනුයේ,
(i) දළ සීරුමාරුව ය. (ii) දර්පණ ය. (iii) ප්‍රාචීරය ය. (iv) උපනෙත ය.

05. පහත ඇටවුමෙහි රබර් පටලය බෝතලය තුළට තල්ලු කරන විට ලැබෙන නිරීක්ෂණයක් වන්නේ,
(i) බැලුනයෙහි වෙනසක් සිදුනොවේ.
(ii) බැලුනය පිම්බේ.
(iii) බැලුනය හැකිලේ.
(iv) වීදුරු නළය තුළින් වාතය පිටවේ.




06. විටමින් A බහුලව අඩංගු ආහාරයකි.
(i) බතල (ii) කරටි (iii) ගෝවා (iv) මාළු

07. පෘථිවි අභ්‍යන්තරය විස්තර කිරීමට දරුවකු විසින් තැම්බූ බිත්තරයක් දෙකට පලා පෙන්වන ලදී. මෙහි බිත්තර කටුවෙන් ආදර්ශනය කරන ලද්දේ.
(i) පෘථිවි හරයයි. (ii) පෘථිවි ප්‍රාවරණයයි.
(iii) පෘථිවි කබොලයි. (iv) පිටත හරයයි.

08. PVC බටයක් පොලිතින් කොළයකින් පිරිමැදීමෙන් සිදුනොවන්නේ,
(i) පිරිසිදු වේ.
(ii) විදුලි ධාරාවක් ඇතිවේ.
(iii) රත්වේ.
(iv) සිහින් කඩදාසි කැබලි ඇද ගනියි.








- www.pastpapers.wiki -

- www.pastpapers.wiki -

09. රූපයේ දක්වා ඇති LED අඩංගු පරිපථ දෙකෙන් කුමන LED දැල්වේ ද?




(i) A LED ය දැල්වේ. B LED ය දැල්වේ.
(ii) A LED ය දැල්වේ. B LED ය නොදැල්වේ.
(iii) A LED ය නොදැල්වේ. B LED ය දැල්වේ.
(iv) A LED ය නොදැල්වේ. B LED ය නොදැල්වේ.

10. පාසල් විද්‍යාගාරයේ ඇති ද්‍රවයන් දෙකකට නිල් හා රතු ලිට්මස් කැබලි එක බැගින් යොදන ලදී. මේ අනුව ලබාදිය හැකි නිගමනය වන්නේ,




(i) A අම්ලයකි. B භෂ්මයකි.
(ii) A භෂ්මයකි. B අම්ලයකි.
(iii) A අම්ලයකි. B අම්ලයකි
(iv) A භෂ්මයකි. B භෂ්මයකි.

| A | B |
|---|---|
| නිල් ලිට්මස් රතුවිය. රතු ලිට්මස්වල වර්ණය වෙනස් නොවීය. | රතු ලිට්මස් නිල්විය. නිල් ලිට්මස්වල වර්ණය වෙනස් විය. |

11. රසායනික ශක්තිය විද්‍යුත් ශක්තිය බවට පරිවර්තනය වන උපකරණයක් වන්නේ,
(i) ඩයිනමෝව ය.
(ii) විදුලි සීනුව ය.
(iii) ජල ට'බයිනය ය.
(iv) වියළි කෝෂය ය.

12. වාහනයක පැති කණ්ණාඩියකින් වස්තුවක් දෙස නිරීක්ෂණය කළ විට ප්‍රතිබිම්බය
(i) විශාලව පෙනෙයි.
(ii) යටිකුරුව පෙනෙයි.
(iii) කණ්නාඩිය ඉදිරියෙන් පෙනෙයි.
(iv) වම දකුණ මාරුවී පෙනෙයි

13. පටක නිරීක්ෂණය කිරීමේ දී පහත රූපයේ දක්වා ඇති නිරීක්ෂණය ලැබෙනුයේ,



(i) හෘද පේශි පටකයේ ය.
(ii) රුධිර පටකයේ ය.
(iii) ස්නායු පටකයේ ය.
(iv) අපිචර්මීය පටකයේ ය.

14. ජෛව ගෝලය පවතින තුරු කිසි දිනෙක අවසන් නොවන ශක්ති ප්‍රභවයක් වන්නේ,
(i) ඛනිජ තෙල් ය.
(ii) ගල් අඟුරු ය.
(iii) දර ය.
(iv) පෙට්‍රල් ය.

15. ලිප මත භාජනයක් තැබීමේ දී අත පිළිස්සීමට වඩාත් ම ඉඩකඩ ඇත්තේ,




(i) භාජනයේ රස්නයෙන්
(ii) තාප විකිරණ හේතුවෙන්
(iii) තාප සංවහන ධාරා මගින්
(iv) තාප සන්නයනයෙන්




- www.pastpapers.wiki -

- www.pastpapers.wiki -

16. විද්‍යුත් ආරෝපණ ගබඩා කිරීම සිදුකරන උපාංගය,
(i) ධාරිත්‍රකයයි.
(ii) ඩයෝඩයයි.
(iii) වියළි කෝෂයයි.
(iii) ප්‍රතිරෝධකයයි.

17. ක්‍රිකට් පිත්තකින් එකම බලයකින් පන්දුවකට පහර දුන්නේ නම් පන්දුව මත වැඩි බලයක් යෙදෙනුයේ කුමන ස්ථානයේ පන්දුව ගැටුන විටදී ද?
(i) B
(ii) A
(iii) C
(iv) D




18. පාෂාණ චක්‍රයේ වඩාත් ඉහළ උෂ්ණත්වයක් පවතින්නේ කුමන අවස්ථාවේදී ද?




(i) A
(ii) B
(iii) C
(iv) D

19. රූපයේ දක්වා ඇති ස්පීකරයට කෝෂ මගින් විදුලිය සපයන විට ශබ්දයක් ගොඩ නැගෙනුයේ,



(i) කෝෂ සම්බන්ධ කර ඇතිවිට දී පමණි.
(ii) කෝෂ විසන්ධිකර ඇති විට දී පමණි.
(iii) කෝෂ සම්බන්ධ කරන විට දී පමණි.
(iv) කෝෂ සම්බන්ධ කරන විට දී හා විසන්ධි කරන විටදී පමණි.

20. පහත දක්වා ඇති වගන්තිවලින් කවරක් නිවැරදි වේ ද?
A කළු පැහැති පෘෂ්ඨ විකිරණ තාපය හොඳින් අවශෝෂණය කරයි.
B කළු පැහැති පෘෂ්ඨවලින් ඉතාමත් වේගයෙන් තාපය හානි වේ.
C දිලිසෙන පෘෂ්ඨ වේගයෙන් තාපය හානි කරයි.

(i) A හා C පමණි.
(ii) B හා C පමණි.
(iii) A හා B පමණි.
(iv) A, B, C පමණි.

(ලකුණු 2×20 = 40)



- www.pastpapers.wiki -

- www.pastpapers.wiki -

## II කොටස

- පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

01. A පහත දක්වා ඇත්තේ පොකුණු පරිසරයකි.



(i) මෙම පොකුණු පරිසරයේ දැක්වෙන සතුන් හතරදෙනා දෙබෙදුම් සුවියක් ආධාරයෙන් වෙන් කර දක්වන්න. (ල. 04)

(ii) මෙම පොකුණු පරිසරයේ ජීවත්වන පෘෂ්ඨවංශී සතෙකු හා අපෘෂ්ඨවංශී සතෙකු නම් කරන්න. (ල. 01)

(iii) මෙහි ඔබ දකින මැඩියා ඉහත පරිසරයේ ජීවත්වීමට දක්වන අනුවර්තනයක් ලියන්න. (ල. 01)

B




(i) ඉහත රූපයේ දැක්වෙන A හා B බණ්ඩක්කා කරල් ජලය මත තබා එකවර මුදාහැරිය විට X සිට Y දක්වා ඉක්මනින් ගමන් කරන්නේ A හා B කැබලිවලින් කුමක් ද? (ල. 01)

(ii) බණ්ඩක්කා කැබලි X සිට Y දක්වා ඉක්මනින් ගමන් කරන වේගය වැඩි කිරීමට යොදා ගත හැකි වෙනත් උපක්‍රමයක් ලියන්න. (ල. 01)

C

(i) පෘථිවි වායු ගෝලයේ ස්තර පහත දැක්වේ. ඒවා රූපය සමඟ යා කරන්න.

a පරිවර්තී ගෝලය
b ස්තර ගෝලය
c මධ්‍ය ගෝලය
d තාප ගෝලය
e බහිර් ගෝලය




(ල. 02)





- www.pastpapers.wiki -

(ii) කර්මාන්ත ශාලාවකින් වායු දූෂණයට හේතුවන පහත සඳහන් සංඝටක වාතයට එනතු වේ. (කාබන් අංශු, කාබන් මොනොක්සයිඩ්, සල්ෆර් ඩයොක්සයිඩ් නොදැවුණු ඉන්ධන බිඳිති.) ඒවා වායුමය දූෂක හා අංශුමය දූෂක ලෙස වෙන්කර දක්වන්න. (ල. 01)

(iii)




ඉහත දක්වා ඇත්තේ පසෙහි ජලය අඩංගු බව පෙන්වීම සඳහා විද්‍යාගාරයේ සිදුකළ ක්‍රියාකාරකමට යොදාගත් උපකරණ කිහිපයකි.
ඉහත උපකරණ භාවිත කර සිදු කළ ක්‍රියාකාරකමට අදාළ ඇටවුම ඇඳ දක්වන්න. (ල. 01)

(iv) කැකෑරුම් නළයෙහි ජල අංශු රැඳෙන ස්ථානය 'X' ලෙස නම් කරන්න. (ල. 01)

(v) එම ද්‍රව අංශු ජල අංශු බව තහවුරු කර ගැනීමට
(a) විද්‍යාගාරයේ දී ඔබට භාවිතා කළ හැකි රසායනික ද්‍රව්‍යයක් නම් කරන්න.
(b) එහිදී ඔබට ලැබෙන නිරීක්ෂණය කුමක් ද?
(c) මෙම ඇටවුමේ දී පරීක්ෂා නළ අල්ලුවක් භාවිත කිරීමේ වාසිය සඳහන් කරන්න. (ල. 03)

(මුළු ලකුණු 16)

02. A




ඉහතින් දක්වා ඇත්තේ ද්වී බීජ පත්‍රී ශාක පුෂ්පයක සිරස් කඩකි.
(i) එහි (a) හා (b) නම් කරන්න. (ල. 02)

B

(i) ඔබ උදේ ආහාරය සඳහා ආපන ශාලාවෙන් මිල දී ගත් රෝල්ස්, සුදු කඩදාසියක මතා තිබුණි. ටික වේලාවක දී ඔබට දැකිය හැකි වූ නිරීක්ෂණයක් ලියන්න. (ල. 01)

(ii) එසේ වීමට හේතු වූ පෝෂකය කුමක් ද? (ල. 01)

(iii) ඔබ ආහාර ගැනීමේ දී මුඛ කුහරය තුළ ඇති දත් මගින් ඉටුවන කාර්යය කුමක් ද? (ල. 01)

(iv) පොලිතීන් මල්ලක්, සිහින් සේලයින් බටයක්, රබර් පටි, මහත හා සිහින් රබර් නළ ඔබට සපයා ඇත්නම් ආහාර ජීරණ පද්ධතියේ ආකෘතියක් තැනීමේ දී ආමාශය ලෙස යොදාගත හැකි ද්‍රව්‍යය කුමක් ද? (ල. 01)

(v) ජීරණයෙන් පසු අවශෝෂණය නොවී ඉතිරි වූ ආහාරයට කුමක් සිදුවේ ද? (ල. 01)



- www.pastpapers.wiki -

- www.pastpapers.wiki -

C

(i) ඉහත රූපයට අනුව අන්වීක්ෂයන් රැගෙන යාමේ දී අනුගමනය කර ඇති ආරක්ෂක පියවරක් සඳහන් කරන්න. (ල. 01)

(ii) අන්වීක්ෂය දිගු කලක් භාවිතා නොකරන්නේ නම් කාචවල ආරක්ෂාව සඳහා ගත යුතු ක්‍රියා මාර්ගයක් ලියන්න. (ල. 01)

(iii) සරල අන්වීක්ෂයක ×4 ලෙස දක්වා ඇත. මෙය භාවිත කර මි.මි.10ක වස්තුවක් නිරීක්ෂණය කරන විට කොපමණ විශාලව පෙනෙයි ද? (ල. 01)

(iv) පහත දක්වා ඇති ජීවී දේහ සංවිධාන සටහනෙහි A ලෙස හඳුන්වන සංවිධාන මට්ටම කුමක් ද?

සෛලය → පටකය → A.................................. පද්ධතිය → ශාකය

(ල. 01)

(මුළු ලකුණු 11)

03. A




ඉහත විදුලි සීනුව රූපයේ පරිදි උපකරණ සැකසූ විට ක්‍රියාත්මක වේ.

(i) මෙම ඇටවුම තුළ දැක ගත හැකි ශක්ති ආකාර දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) මෙහි දර්පණය භාවිතා කර ඇත්තේ කුමන කාර්යයක් සඳහා ද? (ල. 01)

(iii) විදුලි සීනුව ක්‍රියාත්මක වීම වැළැක්වීමට ගත හැකි ක්‍රියා මාර්ගයක් ලියන්න. (ල. 01)

(iv) සූර්ය ශක්තිය භාවිතයේ ඇති වාසියක් සහ අවාසියක් සඳහන් කරන්න. (ල. 02)

(v) ටික වේලාවක් සූර්යාලෝකයට නිරාවරණය වී තිබීමෙන් සූර්ය කෝෂයේ සිදුවන වෙනස්කමක් සඳහන් කරන්න. (ල. 01)

(vi) ආලෝකය නොමැති විට විදුලි සීනුව ක්‍රියාත්මක කිරීමට හැකි වෙනත් ක්‍රමයක් සඳහන් කරන්න. (ල. 01)



- www.pastpapers.wiki -

B




(i) බීම බටය ආරෝපණය කර ගැනීමට කුමක් සිදුකළ යුතු ද? (ල. 01)

(ii) එසේ ජනනය වන ආරෝපණ හඳුන්වන නම කුමක් ද? (ල. 01)

(iii) ආරෝපණය කිරීමෙන් පසු පොලිතීන් පටලය බටයට ලං කළ විට කුමක් සිදුවේ ද? (ල. 01)

(මුළු ලකුණු 11)

04. A




(i) මෙහි වඩාත් දීප්තියෙන් වැඩි කලාපය කුමක් ද? (ල. 01)

(ii) මෙහි පූර්ණ ඡායාව හා උප ඡායාව නම් කරන්න. (ල. 02)

(iii) පටල කම්පනයෙන් ශබ්දය උපදවන භාණ්ඩයක් නම් කරන්න. (ල. 01)

(iv) දුම්රියක් ඇත එන බව රේල් පීල්ලට කන තබා වේලාසනින් දැන ගත හැකිවන්නේ ඇයිදැයි පහදන්න. (ල. 01)

B




(i) ඉහත ඇටවුමේ ඔබ නිරීක්ෂණය කරන්නේ කුමක් ද? (ල. 01)

(ii) ඉහත ඇටවුමේ පාට කළ ජලය යොදා ගන්නේ ඇයි? (ල. 01)

(iii) බෝතලය තුළ වායු බුබුළු නොරැඳි ඇබය සවිකර ගැනීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ගයක් ලියන්න. (ල. 01)

C ක්‍රීඩා (snakes & ladders) බෝඩ් එකක කොටසක් ඔබට දී ඇත.




(i) 10 සිට 26 දක්වා ගමන් කිරීමට ඔහු පසු කළ යුතු කොටු ගණන සොයන්න. (ල. 01)

(ii) 10 සිට 26 දක්වා ගමන් කිරීමට යොදා ගත හැකි කෙටිම මග කුමක් ද? (ල. 01)

(iii) චලිතයේ දී එම මග හඳුන්වන නම කුමක් ද? (ල. 01)

(මුළු ලකුණු 11)

05. A නිමාලි පොකුරු වද මල් තම්බා ගත් ජලයෙන් බීමක් පිළියෙල කරන ලදී. එයට දෙහි යුෂ මිශ්‍ර කිරීමත් සමග එහි පැහැය වෙනස් විය.

(i) එහි දී වද මල් තම්බාගත් ජලය ක්‍රියා කරන්නේ කුමක් ලෙස ද? (ල. 01)

(ii) ඔබට පරිසරයෙන් සපයා ගත හැකි එවැනි වෙනත් උදාහරණයක් ලියන්න. (ල. 01)

(iii) විද්‍යාගාරයේ ඇති ද්‍රාවණ බෝතලයක ලේබලය ගැල වී ඇති බව දැකිය හැකි විය. එහි ඇති ද්‍රාවණය අම්ලයක් හෝ හස්මයක් දැයි හඳුනා ගැනීමට ඔබට භාවිත කළ හැකි විද්‍යාගාරයේ තිබෙන ද්‍රව්‍ය දෙකක් නම් කරන්න. (ල. 02)

B මාළු ටැංකියක අලංකාරය සඳහා එහි පතුලේ ගල් තැන්පත් කර තිබෙනු ඔබ දැක ඇත.

කළු ගල්

තිරිවානා ගල්

ඉහතින් දක්වා ඇත්තේ එවැනි ඛනිජයක හා පාෂාණයක රූප සටහන් දෙකකි.

(i) ඛනිජයක හා පාෂාණයක දක්නට ලැබෙන වෙනස්කමක් ලියන්න. (ල. 01)

(ii) ඉහත රූපයේ දක්වන ඛනිජය හා පාෂාණ වෙන්කර දක්වන්න. (ල. 02)

(iii) වීදුරුවකට තද උණුසුම් ජලය දැමූ විට එය පුපුරා යාමට හේතුව පැහැදිලි කරන්න. (ල. 02)

(iv) රාත්‍රී කාලයේ මාළු ටැංකියක සිටින මත්ස්‍යයින් ටැංකියේ ඇති ජලයේ ඉහළ ස්ථරයට පැමිණෙන බව දැකිය හැකි විය. එයට හේතුව කුමක් ද? (ල. 02)

(මුළු ලකුණු 11)

- www.pastpapers.wiki -

06. A

(i) පස් සාම්පලය ජලයට දමා හොඳින් සොලවා නිසොල්මන්ව තබන ලදී. එහි පහත දැක්වෙන ස්ථානවල දැකගත හැකි කොටස් අදාළ ස්ථානයේ ලියන්න.
**(මැටි, රොන්මඩ, රළුවැලි, බොරළු)** (ල. 02)

(ii) ජලය මතුපිට දැකගත හැකි කොටස් මොනවා ද? (ල. 01)

(iii) මැටි පසක හා වැලි පසක සංයුතියෙහි ඇති වෙනස්කමක් ලියන්න. (ල. 01)

(iv) පාංශු ඛාදනයෙන් ඇතිවිය හැකි පාරිසරික ගැටළුවක් ලියන්න. (ල. 01)

B

(i) ගලායන ජලයේ අන්තර්ගත වන ශක්ති ආකාරය කුමක් ද? (ල. 01)

(ii) එම ශක්තිය භාවිතයෙන් ඉටු කරගන්නා කාර්යයන් 02ක් ලියන්න. (ල. 02)

(iii) තීන්ත වර්ග දිය කර ගැනීම සඳහා ජලය භාවිතා කරයි. ඒ සඳහා භාවිතා කෙරෙනුයේ ජලයේ කුමන ගුණය ද? (ල. 01)

C

(i) පස සරු කිරීමට උපකාරී වන ජීවීන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 01)

(ii) පස පෙරළීමෙන් පසට එකතුවන එක් සාධකයක් ලියන්න. (ල. 01)

(මුළු ලකුණු 11)

07. A සුදුසු වචන වරහන් තුළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.
**(නිව්ටන්, මීටරය, කම්පන, උෂ්ණත්වමානය, අවතල දර්පණය)**

(i) දුර මැනීමේ අන්තර්ජාතික ඒකකය ........................................................ වේ.

(ii) රෝගයක් හඳුනා ගැනීම සඳහා මූලික වශයෙන් ම අවශ්‍ය උපකරණයකි. ........................................................

(iii) බලයේ අන්තර්ජාතික ඒකකය ........................................................ වේ.

(iv) ධ්වනිය ජනනය වීමට ........................................................ සිදුවිය යුතු වේ.

(v) අභිසාරී ආලෝක කදම්භයක් ගොඩනගා ගැනීමට භාවිත කරනු ලබන උපකරණයකි.
........................................................ (ල. 1×5 = 05)

B පහත දැක්වෙන වගන්ති නිවැරදි නම් (√) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද, යොදන්න.

(i) පොල් සම්බෝල තුලිත ආහාරයකි. ( )

(ii) වියළි කෝෂය රසායනික කෝෂයකි. ( )

(iii) නිවසේ විදුලි සැපයුම සරල ධාරාවකි. ( )

(iv) වායු ගෝලයේ බහුලතම වායු වර්ගය වන්නේ ඔක්සිජන් ය. ( )

(v) භූ තැටි චලන මගින් භූමි කම්පා හටගනී. ( )

(vi) මුහුදු සුළං ඇතිවන්නේ දිවා කාලයේ ය. ( ) (ල. 1×6 = 06)

(මුළු ලකුණු 11)



- www.pastpapers.wiki -

- www.pastpapers.wiki -

## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2016
## පිළිතුරු
### I කොටස

| | | | |
|---|---|---|---|
| 01. - (ii) | 02. - (iv) | 03. - (iii) | 04. - (i) |
| 05. - (iii) | 06. - (ii) | 07. - (iii) | 08. - (ii) |
| 09. - (ii) | 10. - (i) | 11. - (iv) | 12. නිවැරදි පිළිතුරක් නැත. (All) |
| 13. - (ii) | 14. - (iii) | 15. - (ii) | 16. - (i) |
| 17. - (ii) | 18. - (i) | 19. - (iii) | 20. - (iii) |

### II කොටස

01. A (i)




★ සුදුසු දෙබෙදුම් සුචියකට

(ii) පෘෂ්ඨවංශී - මාළුවා, ගෙම්බා
අපෘෂ්ඨවංශී - ගොළුබෙල්ලා, හැකරැල්ලා

(iii) ඇඟිලි අතර බැඳි පටල පිහිටීම, ශ්වසනයට සම භාවිතා කිරීම.

B (i) A

(ii) 10g ස්කන්ධ වෙනුවට සමාන ක්ලේ ගුලි යෙදීම.

C (i) B - තාප ගෝලය C - මධ්‍ය ගෝලය
D - ස්තර ගෝලය E - පරිවර්තී ගෝලය

(ii) වායුමය දූෂක - කාබන් මොනොක්සයිඩ්, සල්ෆර් ඩයොක්සයිඩ්
අංශුමය දූෂක - කාබන් අංශු, නොදැවුණු ඉන්ධන බිඳිති.



- www.pastpapers.wiki -

(iii)




(v) a - නිර්ජලීය කොපර් සල්ෆේට්
b - නිර්ජලීය කොපර් සල්ෆේට්වල
සුදු පැහැය → නිල් වේ.
c - අත පිලිස්සීම වැළැක්වීම.
පරීක්ෂා නළය හොඳින් රත් කළ හැකි වීම.

02. A (i) a - කලංකය b - රේණු

B (i) සුදු කඩදාසියේ පාරභාෂක තෙල් පැල්ලමක් තිබීම.

(ii) ලිපිඩ

(iii) ආහාර කුඩා කැබලි බවට පත් කිරීම.

(iv) පොලිතීන් මල්ල

(v) ජලය අවශෝෂණය වී ඉතිරිය මළ ද්‍රව්‍ය ලෙස දේහයෙන් බැහැර වේ.

C (i) පාදය යටින් අත තබාගෙන සිටීම/ බඳෙන් අල්ලාගෙන සිටීම.

(ii) කාච ගලවා සිලිකා ජෙල් හෝ නිර්ජලීය කැල්සියම් ක්ලෝරයිඩ් අඩංගු ඩෙසිකේටරයක බහාලීම.

(iii) 10 × 4 = 40mm

(iv) අවයවය

03. A (i) ආලෝක ශක්තිය, විද්‍යුත් ශක්තිය

(ii) ආලෝක කිරණ පරාවර්තනයට

(iii) දර්පණය ඉවත් කිරීම

(iv) වාසිය - නොමිලයේ ලබාගත හැකි වීම.
පරිසර දූෂණයක් නැති වීම.
අවාසිය - මූලික වියදම අධික වීම.
දියුණු තාක්ෂණයක් අවශ්‍ය වීම.

(v) එහි විද්‍යුත් ශක්තිය ගබඩා වීම.

(vi) වියළි කෝෂ සම්බන්ධ කිරීම.

B (i) පොලිතීන් කැබැල්ලකින් පිරිමැදීම.
(ii) ස්ථිති විද්‍යුත් ආරෝපණ

(iii) විකර්ශණය වේ.

04. A (i) A

(ii) පූර්ණ ඡායාව - A උප ඡායාව - B

(iii) බෙරය, රබාන, දවුල, උඩැක්කිය

(iv) වාතයේ දීට වඩා ඝණ ද්‍රව්‍යය තුළින් ධ්වනිය වේගයෙන් සම්ප්‍රේෂණය වන නිසා

- www.pastpapers.wiki -

B (i) බටය තුළ ජල මට්ටම ඉහළ නැගීම.

(ii) ජලය අවර්ණ නිසා පහසුවෙන් නිරීක්ෂණ ලබාගැනීමට.

(iii) බෝතලය සම්පූර්ණයෙන්ම ජලයෙන් පුරවා ඇබය සවි කිරීම.

C (i) 26 - 10 = 16

(ii) ඉනිමඟ දිගේ යාම

(iii) විස්ථාපනය

05. A (i) දර්ශකයක් ලෙස

(ii) කටරොළු මල් තම්බා ගත් වතුර/ පුවක් තැම්බූ වතුර/ කහ තැම්බූ වතුර/ දම් ගෝවා තැම්බූ වතුර

(iii)
- ලිට්මස් කඩදාසි (රතු, නිල්)
- PH කඩදාසි
- ෆිනොප්තලීන්
- මෙතිල් ඔරේන්ජ්

B (i) ඛනිජයක් සෑදී ඇත්තේ සංඝටක එකකිනි. නමුත් පාෂාණයක් සෑදී ඇත්තේ සංඝටක කිහිපයකිනි.
ඛනිජ නිශ්චිත ජ්‍යාමිතික හැඩයකින් යුත් ස්ඵටික ලෙස පවතින නමුත් පාෂාණවලට නිශ්චිත ජ්‍යාමිතික හැඩ නැත.

(ii) ඛනිජය - තිරිවානා
පාෂාණය - කළු ගල්

(iii) වීදුරුව ප්‍රසාරණය වන නිසා.

(iv) රාත්‍රී කාලයේදී ටැංකිය තුළට ආලෝකය නොලැබෙන නිසා ජලජ ශාක ප්‍රභාසංශ්ලේෂණය නොකරයි. එවිට ඔක්සිජන් නිපදවෙන්නේ නැත. එමනිසා මත්ස්‍යයින් ශ්වසනයට වායු ගෝලීය ඔක්සිජන් වැඩිපුර දියවන ජලයේ ඉහළ ස්ථරයට පැමිණෙයි.

06. A (i) A - බොරළු B - රළු වැලි
C - රොන්මඩ D - මැටි අංශු මිශ්‍ර ජලය

(ii) ශාක හා සත්ත්ව කොටස්

(iii)
- මැටි පසෙහි මැටි ප්‍රතිශතය වැඩිය.
- වැලි පසෙහි වැලි ප්‍රතිශතය වැඩිය.
- මැටි පසෙහි රොන්මඩ ප්‍රතිශතය වැඩිය.

(iv)
- ගස් ඉදිරී වැටීම.
- ජලාශවලට පස් එකතු වී ඒවා ගොඩවීම./ ගැඹුර අඩුවීම.
- පස නිසරු වීම.

B (i) චාලක ශක්තිය

(ii)
- ජල විදුලිය නිපදවීම.
- ජල රෝද ක්‍රියාකරවීම.

(iii) ද්‍රාවක ගුණය

C (i) ගැඩවිලා, බැක්ටීරියා

(ii) වාතය

07. A (i) මීටරය (ii) උෂ්ණත්වමානය
(iii) නිව්ටන් (iv) කම්පන
(v) අවතල දර්පණය

B (i) × (ii) √
(iii) × (iv) ×
(v) √ (vi) √


- www.pastpapers.wiki -